# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/63 - 2023 ජූලි මස 21 වැනි සිකුරාදා - 2023.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියමය

ආයෝජන ප්‍රවර්ධන වැඩ බලන අමාත්‍ය දිලුම් අමුණුගම වන මම, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2023 මාර්තු 28 දිනැති අංක 2325/06 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියමය සඳහා තවදුරටත් සංශෝධනයක් වශයෙන් එකී නියමයේ ඇමුණුම - ඒ යටතේ, මෙම නියමය මගින් 2023 ජූලි මස 22 වැනි දින සිට නව ඡේදයක් (xxi) ඇතුළත් කරමි.

**දිලුම් අමුණුගම,**
*වැඩ බලන* ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2023 ජූලි මස 20 වැනි දින,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය,
කොළඹ දී ය.

**ඇමුණුම - ඒ**

(xxi) කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, මුද්‍රණ තීන්ත නිෂ්පාදන කාර්යය සඳහා ලියාපදිංචි මුද්‍රණ තීන්ත නිෂ්පාදකයන් විසින් අමුද්‍රව්‍ය වශයෙන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 3903.90.10 යටතේ වර්ගීකරණය වන ජලමූල සමජාතීය අවයවික (හෝමෝ පොලිමර්) සහ බහුඅවයවික (කොපොලිමර්) සහ 3906.90.10 යටතේ වර්ගීකරණය වන ජලමූල ඇක්‍රිලික් සමජාතීය අවයවික (හෝමෝ පොලිමර්) සහ බහුඅවයවික (කොපොලිමර්) ආනයනය.

EOG 07-0228

1A - PG 6407— 431 (2023/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*